# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 527 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 26/03/2024<br>පැය 0945 |

## මාධ්‍ය නිවේදනය

**සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් අත්අඩංගුවට ගැනීම සඳහා දිවයින පුරා ක්‍රියාත්මක විශේෂ මෙහෙයුම - පොලිස් මූලස්ථානය.**

2024.03.19 වන දින සිට බස්නාහිර පළාත හා දකුණු පළාත මූලික කර ගෙන ක්‍රියාත්මක සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් අත්අඩංගුවට ගැනීම සඳහා දිවයිනම ආවරණය වන පරිදි විශේෂ පොලිස් කණ්ඩායම් 20 ක් යොදවා මෙහෙයුම් ආරම්භ කරන ලදී.

**එම මෙහෙයුම් මඟින්, 2024.03.25 වන දිනය තුල සිදු කරන ලද වැටලීම් වලදී සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් 12 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.**

ඒ අනුව මෙම මෙහෙයුම් ආරම්භ කරන ලද 2024.03.19 වන දින සිට 2024.03.25 වන දින දක්වා සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් 63 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. මෙම සැකකරුවන් රැඳවුම් නියෝග මත රඳවා තබා ගෙන වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

මෙම විශේෂ මෙහෙයුමේ නිරත නිලධාරීන් විසින් ඉහත සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයන් 12 දෙනා අත්අඩංගුවට ගැනීමට අමතරව 2024.03.25 වන දින සිදු කරන ලද වැටලීම් වලදී තවත් සැකකරුවන් 06 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**